# පාර්ලිමේන්තු විත්ති

පුවත් හසුන | 25 වැනි කාණ්ඩය | ජූලි 2022




## ගරු රනිල් වික්‍රමසිංහ මහතා මෙරට අට වැනි විධායක ජනාධිපතිවරයා ලෙස පාර්ලිමේන්තු සංකීර්ණයේදී දිවුරුම් දෙයි.

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ අට වැනි විධායක ජනපතිවරයා ලෙස ගරු රනිල් වික්‍රමසිංහ මහතා මේ මස 21 පෙරවරුවේ අගවිනිසුරු ජයන්ත ජයසූරිය මහතා ඉදිරියේ දිවුරුම් දුන්නේය.

සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව







පුවත්

කාරක සභා පුවත්

විශේෂාංග

පාර්ලිමේන්තු විදු පියසෙන්

කවරයේ කතාව

පාර්ලිමේන්තු ඡායා ගැලරිය

# අන්තර්ගතය

## කාරක සභා පුවත්

- පෙට්‍රල් සහ ඩීසල් ආසන්න වශයෙන් රුපියල් 250ක මිලකට අළෙවි කළ හැකි බවට ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ සභාපති කෝප් කමිටුවේදී පෞද්ගලික ප්‍රකාශයක් සිදු කරයි.

## පුවත්

- අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ඉල්ලා අස්වීමේ ලිපිය තමා වෙත ලැබුණු බව නිවේදනය කරමින් කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා නිකුත් කළ මාධ්‍ය නිවේදනය
- 8 වැනි විධායක ජනාධිපතිවරයා ලෙස රනිල් වික්‍රමසිංහ මහතා පත් වෙයි
- අග්‍රාමාත්‍ය ධුරයට පත්වීමෙන් පසු ප්‍රථම වරට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා පාර්ලිමේන්තුවට
- පාර්ලිමේන්තුවේ සභානායක ධුරයට ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා පත් කෙරේ
- වජිර අබේවර්ධන මහතා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස දිවුරුම් දෙයි
- මධ්‍යම සහ ඌව පළාතේ උසස් පෙළ දේශපාලන විද්‍යාව හදාරන පාසල් සිසුන් සඳහා "පාර්ලිමේන්තු විදු පියසෙන් " තවත් වැඩසටහනක්

## විශේෂාංග

- පාර්ලිමේන්තුව වාර අවසාන කිරීම සිදු වන්නේ කොහොමද?
- 1981 අංක 2 දරන ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත ප්‍රකාරව ජනාධිපතිධුරය හිස්වූ අවස්ථාවක ජනාධිපතිවරයා තෝරා පත්කරගන්නා ආකාරය

# කවරයේ කතාව



## ගරු රනිල් වික්‍රමසිංහ මහතා මෙරට අට වැනි විධායක ජනාධිපතිවරයා ලෙස පාර්ලිමේන්තු සංකීර්ණයේදී දිවුරුම් දෙයි.


ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ අට වැනි විධායක ජනපතිවරයා ලෙස ගරු රනිල් වික්‍රමසිංහ මහතා මේ මස 21 පෙරවරුවේ අගවිනිසුරු ජයන්ත ජයසූරිය මහතා ඉදිරියේ දිවුරුම් දුන්නේය.

පාර්ලිමේන්තු සංකීර්ණයේ දී පැවති මෙම අවස්ථාවට කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා, විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මහතා, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩලස් අලහප්පෙරුම මහතා ඇතුළු මැතිඇමතිවරු පිරිසක් ද ජනාධිපති ආර්යාව මහාචාර්ය මෛත්‍රී වික්‍රමසිංහ මහත්මිය ද එක්ව සිටියහ.

හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ඉල්ලා අස්වීමෙන් පුරප්පාඩුව පැවැති ජනාධිපතිධූරය සඳහා අනුප්‍රාප්තික ජනාධිපතිවරයෙකු තෝරා පත්කර ගැනීමේ රහස් ඡන්දය මේ මස 20 වැනි දා පැවැති අතර එහිදී වැඩබලන ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා ඡන්ද 134 ලබාගනිමින් අනුප්‍රාප්තික ජනාධිපති ධූරයට පත් වීමට සුදුසුකම් ලැබීය.

# පුවත්

# අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ඉල්ලා අස්වීමේ ලිපිය තමා වෙත ලැබුණු බව නිවේදනය කරමින් කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා නිකුත් කළ මාධ්‍ය නිවේදනය



කථානායක, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
சபாநாயகர், இலங்கை பாராளுமன்றம்
Speaker, Parliament of Sri Lanka

2022.07.15

මාධ්‍ය නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 38.1 ( ආ ) ව්‍යවස්ථාව ප්‍රකාරව අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා විසින් එවන ලද ඉල්ලා අස්වීමේ ලිපිය මා වෙත ලැබී ඇත. ඒ අනුව 2022 ජුලි මස 14 වන දින සිට ජනාධිපතිවරයා සිය ධුරයෙන් නීත්‍යානුකූලව ඉල්ලා අස්වී ඇත. ඒ අනුව මෙතැන් පටන් නව ජනාධිපතිවරයෙකු තෝරා පත්කර ගැනීමේ ව්‍යවස්ථාමය ක්‍රියාදාමය ක්‍රියාත්මක වනු ඇත. එම ක්‍රියාදාමය අවසන් වන තෙක් ජනාධිපති ධුරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා ව්‍යවස්ථා ප්‍රකාරව අග්‍රාමාත්‍යවරයා කටයුතු කරනු ඇත.

නව ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පක්ෂ නායක රැස්වීමේදී මා විසින් සියලු පක්ෂ නායකයින් දැනුවත් කළ ආකාරයට, 1981 අංක 02 දරණ ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ විශේෂ විධිවිධාන පනත සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 40 වන ව්‍යවස්ථාව ප්‍රකාරව ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම ක්‍රියාදාමය ඉතා ඉක්මනින් සාර්ථකව අවසන් කිරීම මාගේ අරමුණයි. දකුණු ආසියාවේ පැරණිතම ප්‍රජාතන්ත්‍රවාදී රටක් ලෙස ආඩම්බර වන අප රටේ මෙම ක්‍රියාදාමය උපරිම ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක් තුළ හා විනිවිද භාවයකින් ක්‍රියාත්මක කිරීම අප රටේ පමණක් නොව ලෝක දේශපාලන ඉතිහාසයටද වැදගත් ඓතිහාසික සිදුවීමක් වනු ඇත.

එබැවින් මෙම ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියා දාමයට උපරිම සහයෝගය ලබා දෙන ලෙස සියලු පක්ෂ නායකයන්ගෙන්, රාජ්‍ය නිලධාරීන්ගෙන් සහ ආරක්ෂක අංශ නිලධාරීන්ගෙන් ඉල්ලා සිටිමි. විශේෂයෙන්ම අප රටේ ගෞරවනීය හා ආදරණීය මහජනතාවගෙන් ඉල්ලා සිටිනුයේ නිසි ප්‍රජාතන්ත්‍රවාදී පාර්ලිමේන්තු ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම සඳහා පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුම මන්ත්‍රීවරුන්හට නිදහසේ තම හෘදසාක්ෂියට එකඟව කටයුතු කිරීමට හා රැස්වීම සඳහා සහභාගී වීමට සුදුසු සාමකාමී වාතාවරණයක් උදාකර දෙන ලෙසයි. එවැනි සාමකාමී වාතාවරණයක් තුළ සියලු වගකිවයුත්තන්ගේ සහයෝගය ඇතිව දින හතක් වැනි කෙටි කාලයක් තුළ මෙම ක්‍රියාදාමය අවසන් කිරීමට මා බලාපොරොත්තු වෙමි. ඒ අනුව මේ මස 16 වන සෙනසුරාදා දින ( 2022.07.16 ) පාර්ලිමේන්තුව රැස්වන බවත් සියලුම මන්ත්‍රීවරුන්ට සහභාගී වන ලෙසත් මෙයින් දැනුම් දෙමි.

මේ සඳහා ඔබ සියලු දෙනා දක්වන සහයෝගයට ස්තූතිවන්ත වෙමි.

මහින්ද යාපා අබේවර්ධන
කථානායක

# 8 වැනි විධායක ජනාධිපතිවරයා ලෙස රනිල් වික්‍රමසිංහ මහතා පත් වෙයි



1981 අංක 2 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතට අනුව අනුප්‍රාප්තික විධායක ජනාධිපති ධුරය සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වැඩි ඡන්දයෙන් වැඩබලන ජනාධිපති සහ අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මහතා මේ මස 20 වැනි දා තේරී පත් විය.

අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා 2022 මේ මස 14 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්වීම හේතු කොට ගෙන ජනාධිපති ධුරයේ පුරප්පාඩුවක් ඇති වී තිබෙන බව 1981 අංක 2 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 5 වැනි වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ මහලේකම් ධම්මික දසනායක මහතා මේ මස 16 වැනිදා පාර්ලිමේන්තුවට නිවේදනය කළේය.

ඉන් පසු මෙම මස 19 වැනිදා අනුප්‍රාප්තික විධායක ජනාධිපති ධුරය සඳහා පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගෙන් නාමයෝජනා ලබාගැනීම සිදු විය. මෙහිදී වැඩබලන ජනාධිපති සහ අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩලස් අලහප්පෙරුම සහ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අනුර කුමාර දිසානායක යන මහත්වරුන්ගේ නම් මෙසේ අනුප්‍රාප්තික විධායක ජනාධිපති ධුරය සඳහා පාර්ලිමේන්තුවේදී යෝජනා විය.

මේ අනුව ඊට අදාළ ඡන්ද විමසීම මේ මස 20 වැනිදා පාර්ලිමේන්තුවේදී පැවැත්වුණු අතර ගරු රනිල් වික්‍රමසිංහ මහතාට ඡන්ද 134 ක් ලැබී තිබූ අතර ගරු ඩලස් අලහප්පෙරුම මහතාට ඡන්ද 82ක් හිමිවියි මෙහිදී ගරු අනුර කුමාර දිසානායක මහතාට ඡන්ද 03 ක් ලැබී තිබුණි. අනුප්‍රාප්තික ජනාධිපති ධුරය සඳහා තේරී පත්වීමට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් 50% වැඩි ඡන්ද සංඛ්‍යාවක් යම් අපේක්ෂකයෙකු ලබාගත යුතු වූ අතර එම ඡන්ද සංඛ්‍යාව ගරු රනිල් වික්‍රමසිංහ මහතා සපුරා තිබුණි. එනම් වලංගු ඡන්ද සංඛ්‍යාව වූයේ ඡන්ද 219ක් වූ අතර ගරු රනිල් වික්‍රමසිංහ මහතා ඡන්ද 134ක් ලබාගෙන තිබුණි.
හිටපු ජනාධිපති අතිගරු ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ඉල්ලා අස්වීමත් සමග පුරප්පාඩු වූ ජනාධිපතිධුරයේ ඉතිරි ධුර කාලය ධුර දැරීම සඳහා මෙසේ රනිල් වික්‍රමසිංහ මහතා සුදුසුකම් ලැබීය.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා එක්සත් ජාතික පක්ෂයේ ජාතික ලැයිස්තු මන්ත්‍රීවරයෙකු ලෙස පසුගිය 2021 වර්ෂයේ ජුනි මස 23 දින 09 වැනි පාර්ලිමේන්තුවට තේරී පත් විය.

1949 මාර්තු 24 දා උපත ලද රනිල් ශ්‍රියාන් වික්‍රමසිංහ මහතා පසුගිය යහපාලන රජයේ අග්‍රාමාත්‍ය ධුරය ද හෙබවීය.

1970 වසරේ මැද භාගයේදී කැළණිය ආසනයේ එක්සත් ජාතික පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා ලෙස සිය දේශපාලන දිවිය ආරම්භ කළ එතුමා පසුව බියගම ආසනයේ ප්‍රධාන සංවිධායක ධුරයට පත් කෙරුණි. 1977 දී ප්‍රථම වතාවට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තේරී පත්වූ ඒ මහතා ජේ.ආර්. ජයවර්ධන රජයේ කැබිනට් මණ්ඩලයේ සිටි ලාබාලතම අමාත්‍යවරයා වූ අතර එහිදී ඔහු දැරුවේ තරුණ කටයුතු හා රැකීරක්ෂා අමාත්‍ය ධුරයයි. අවුරුදු 28 දී විදේශ කටයුතු නියෝජිත ඇමතිවරයා වූ හෙතෙම, පසුව තරුණ කටයුතු, අධ්‍යාපන සහ කර්මාන්ත, විද්‍යා සහ තාක්ෂණ ලෙස කැබිනට් අමාත්‍යධුර හෙබවීය.

1989 මාර්තු 06 - 1993 මැයි 07 දක්වා කාලය තුළ පාර්ලිමේන්තුවේ සභානායක ධුරයේද කටයුතු කළ වික්‍රමසිංහ මහතා 1994 සිට 2001 දක්වාත් 2004 සිට 2015 දක්වාත් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක ධුරයේ කටයුතු කළේය.

එතුමා ප්‍රථම වතාවට 1993 මැයි 7 වැනිදා ශ්‍රී ලංකාවේ අග්‍රමාතයවරයා ලෙස තේරී පත්වූ අතර 1994 අගෝස්තු 19 දක්වා එම තනතුර හෙබවීය. වික්‍රමසිංහ මහතා, දෙවැනි වරට 2001 දෙසැම්බර් 9 සිට 2004 අප්‍රේල් 02 දක්වාත්, තෙවන වරට 2015 ජනවාරි 9 සිට 2015 අගෝස්තු 21 දක්වාත්, සිව්වන වරට 2015 අගෝස්තු 24 සිට 2018 ඔක්තෝම්බර් 26 දක්වාත්, පස්වන වරට 2018 දෙසැම්බර් මස 16 වන දින සිට 2019 නොවැම්බර් 21 දක්වාත් මෙරට අග්‍රාමාත්‍යවරයා ලෙස කටයුතු කර තිබේ.

කොළඹ රාජකීය විදුහලේ ආදි සිසුවෙකු වන රනිල් වික්‍රමසිංහ මහතා පසුව කොළඹ විශ්ව විද්‍යාලයේ නීති පීඨයට තේරී පත්වී නීතිඥයෙකු ලෙස දිවුරුම් දී තිබේ.





# අග්‍රාමාත්‍ය ධුරයට පත්වීමෙන් පසු ප්‍රථම වරට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා පාර්ලිමේන්තුවට පැමිණෙයි

මෙරට 32 වැනි අග්‍රාමාත්‍යවරයා ලෙස පත්වූ ගරු දිනේෂ් ගුණවර්ධන මහතා එම ධුරයට පත්වීමෙන් පසු ප්‍රථම වරට මේ මස 27 වැනි දා පාර්ලිමේන්තුවට පැමිණියේය.

නව සභානායක අමාත්‍ය (ආචාර්ය) ගරු සුසිල් ප්‍රේමජයන්ත, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක අමාත්‍ය ගරු ප්‍රසන්න රණතුංග, ගරු යදාමිණී ගුණවර්ධන යන මහත්වරු ඇතුළු මැති ඇමතිවරු පිරිසක් සහ අග්‍රාමාත්‍ය ලේකම් අනුර දිසානායක, සභානායක ලේකම්, අග්‍රාමාත්‍ය අතිරේක ලේකම් හර්ෂ විජේවර්ධන, ආණ්ඩු පක්ෂ ප්‍රධාන ලේකම්, ජනාධිපති අතිරේක ලේකම් චමින්ද කුලරත්න යන මහත්වරුන් විසින් පාර්ලිමේන්තුවේ ප්‍රධාන ද්වාරය ඉදිරිපිටදී අග්‍රාමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මහතා පිළිගනු ලැබූහ.
අනතුරුව අග්‍රාමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මහතා, ජනාධිපතිවරයා සහ අග්‍රාමාත්‍යවරයා වෙනුවෙන් වෙන්කර ඇති විශේෂ ද්වාරයෙන් පාර්ලිමේන්තුවේ පිහිටා ඇති අග්‍රාමාත්‍යවරයාගේ කාර්යාලයට පැමිණි අතර එහිදී ගරු වාසුදේව නානායක්කාර, ගරු බන්දුල ගුණවර්ධන, ගරු නිමල් ලන්සා, ගරු සිසිර ජයකොඩි, ගරු වෛද්‍ය ගයාශාන් නවනන්ද යන මහත්වරු ඇතුළු මැති ඇමතිවරු රැසක් සුබ පැතුම් එක් කිරීමට පැමිණ සිටියහ.

පාර්ලිමේන්තුවේ මහලේකම් ධම්මික දසනායක, නියෝජ්‍ය මහලේකම් කුෂාණි රෝහණදීර, සහකාර මහලේකම් ටිකිරි ජයතිලක සහ වේත්‍රධාරී නරේන්ද්‍ර ප්‍රනාන්දු යන මහත්වරු ඇතුළු නිලධාරීහු පිරිසක්ද මෙම අවස්ථාවට එක්ව සිටියහ.







# පාර්ලිමේන්තුවේ සභානායක ධුරයට ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා පත් කෙරේ

■ **ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ධුරයට ගරු ප්‍රසන්න රණතුංග මහතා යළි පත් කෙරේ.**

පාර්ලිමේන්තුවේ නව සභානායකවරයා ලෙස අධ්‍යාපන අමාත්‍ය (ආචාර්ය) ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා පත් කොට තිබේ එමෙන්ම පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ සංවිධායකවරයා ලෙස ගරු නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍ය ගරු ප්‍රසන්න රණතුංග මහතා නැවතත් පත් කොට තිබේ.

මෙම පත්වීම්වලට අදාළ පත්වීම් ලිපි අග්‍රාමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මහතා විසින් පාර්ලිමේන්තුවේ අග්‍රාමාත්‍ය කාර්යාලයේදී මේ මස 27 වැනි දා පෙරවරුවේදී පිරිනමනු ලැබිණි.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ 18 වැනි සභානායකවරයා වන(ආචාර්ය) ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා නුගේගොඩ ශාන්ත ජෝන් විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා ඇති අතර කොළඹ විශ්ව විද්‍යාලයේ නීතිවේදී උපාධිධාරියෙකි. 1984දී ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු ලෙස දිවුරුම් දුන් ඒ මහතා මුල් වරට දේශපාලනයට පිවිසෙන්නේ 1991දී කෝට්ටේ මහ නගර සභාවට තේරී පත්වීමෙනි. 1993දී බස්නාහිර පළාත් සභාවට තේරී පත්වන ප්‍රේමජයන්ත මහතා 1995දී ප්‍රධාන අමාත්‍යවරයා ලෙස තේරීපත්විය.

2000 මහ මැතිවරණයෙන් පාර්ලිමේන්තුවට පිවිසෙන ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා වත්මන් ආණ්ඩුවේ බලශක්ති, ඛනිජතෙල් කර්මාන්ත, විදුලිබල සහ බලශක්ති යන අමාත්‍යධුර හොබවා තිබේ. ඒ මහතා එක්සත් ජනතා නිදහස් සංධානයේ මහලේකම්වරයා ලෙස දීර්ඝ කාලයක්ද කටයුතු කළේය.

ආණ්ඩු පක්ෂයේ සංවිධායකවරයා ලෙස පත් කරනු ලැබූ ගරු ප්‍රසන්න රණතුංග මහතා මින් පෙරද එම ධුරය හෙබවීය. වත්මන් ආණ්ඩුවේ නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යවරයා වන ප්‍රසන්න රණතුංග මහතා මීට පෙර සංචාරක හා මහජන ආරක්ෂාව පිළිබඳ අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළේය. ඔහු ආනන්ද විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙකු වන අතර මීට පෙර බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා ලෙස ද කටයුතු කර තිබේ.



# වජිර අබේවර්ධන මහතා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස දිවුරුම් දෙයි

වජිර අබේවර්ධන මහතා එක්සත් ජාතික පක්ෂයේ ජාතික ලැයිස්තු මන්ත්‍රීවරයෙක් වශයෙන් කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා ඉදිරියේ මේ මස 27 වැනිදා දිවුරුම් දුන්නේය.

කථානායකවරයා ඉදිරියේ දිවුරුම්දීමෙන් පසු ඒ මහතා පාර්ලිමේන්තුවේ මහලේකම් ධම්මික දසනායක මහතා ඉදිරියේදී මන්ත්‍රී නාමලේඛනයේ අත්සන් තැබීය.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා ජනාධිපතිවරයා ලෙස දිවුරුම් දීම නිසා පුරප්පාඩු වූ එක්සත් ජාතික පක්ෂයේ ජාතික ලැයිස්තු මන්ත්‍රීධුරය සඳහා මෙලෙස ගරු වජිර අබේවර්ධන මහතා පත් විය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන සමග කියවිය යුතු 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 64 (5) වැනි වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින්, ඉහත කී පුරප්පාඩුව පිරවීම සඳහා වජිර අබේවර්ධන මහතා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තෝරා පත් කර ගන්නා ලද බව මැතිවරණ කොමිෂන් සභාව විසින් මෙම ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කෙරිණි.



අබේවර්ධන මහතා 1994 මැතිවරණයෙන් එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් ගාල්ල දිස්ත්‍රික්කයෙන් ප්‍රථම වරට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට පත්වී තිබේ. එතැන් පටන් 2010 වර්ෂය දක්වා අබේවර්ධන මහතා එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් ගාල්ල දිස්ත්‍රික්කයෙන් සෑම මැතිවරණයකදීම පාර්ලිමේන්තුවට තේරී පත්වී තිබේ. අනතුරුව 2015 වර්ෂයේ පැවති පාර්ලිමේන්තු මැතිවරණයේදී ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරමින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට පත් විය.

එසේම ඒ මහතා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යවරයා වශයෙන්ද රාජ්‍ය පරිපාලන, කළමනාකරන සහ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති අමාත්‍යවරයා වශයෙන්ද කටයුතු කොට ඇත. තවද ඒ මහතා එක්සත් ජාතික පක්ෂයේ සභාපතිවරයා ලෙස ද වර්තමානයේ කටයුතු කරයි.

වජිර අබේවර්ධන මහතා 1961.09.02 දින උපත ලබා ඇති අතර ගාල්ල මහින්ද විද්‍යාලයෙන් අධ්‍යාපනය හදාරා තිබේ. එසේම ඔහු මොරටුව විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු උපාධි ධාරියෙකි.


## පාර්ලිමේන්තු විදු පියසෙන්


# මධ්‍යම සහ ඌව පළාතේ උසස් පෙළ දේශපාලන විද්‍යාව හදාරන පාසල් සිසුන් සඳහා "පාර්ලිමේන්තු විදු පියසෙන් " තවත් වැඩසටහනක්


පාර්ලිමේන්තු ක්‍රමවේදය පිළිබඳ දැනුම ඔබ වෙත ගෙන "පාර්ලිමේන්තු විදු පියස" වැඩසටහන් මාලාවේ තෙවැනි වැඩසටහන පසුගියදා මධ්‍යම සහ ඌව පළාතේ උසස් පෙළ දේශපාලන විද්‍යාව හදාරන පාසල් සිසුන් සඳහා පැවැත්විණි.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කළ මෙම වැඩසටහනේදී පාර්ලිමේන්තු ක්‍රමවේදය, කාරක සභා ක්‍රමය සහ එහි කාර්යයන් පිළිබඳ සුවිශේෂී අවධානයක් යොමු වූ අතර ඒ සම්බන්ධයෙන් පාසල් සිසුන් දැනුවත් කිරීම පාර්ලිමේන්තුවේ අධ්‍යක්ෂ (පරිපාලන) ජී.තච්චණා රාණි මෙනවිය විසින් සිදු කෙරිණි.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව පිළිබඳව නිවැරැදි තොරතුරු සිසුන් වෙත සන්නිවේදනය කිරීමේ අභිප්‍රාය පෙරදැරිව සංවිධානය කෙරුණු මෙම වැඩසටහන සඳහා පස්සර මධ්‍ය මහා විද්‍යාලය, බණ්ඩාරවෙල දෙමළ මධ්‍ය මහා විද්‍යාලය, ශ්‍රී ගනේෂා විද්‍යාලය, එන්ෆීල්ඩ් දෙමළ මහා විද්‍යාලය, විවේකානන්ද දෙමළ මහා විද්‍යාලය, හෝන්සි විද්‍යාලය, පන්මූර් දෙමළ මහා විද්‍යාලය හා බදුල්ල බාලිකා විද්‍යාලය යන විද්‍යාල වල දේශපාලන විද්‍යාව හදාරණ සිසුන් දහසකට අධික සංඛ්‍යාවක් සහභාගී වීම විශේෂ විය.





# කාරක සභා පුවත්














# පෙට්‍රල් සහ ඩීසල් ආසන්න වශයෙන් රුපියල් 250ක මිලකට අළෙවි කළ හැකි බවට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ සභාපති කෝප් කමිටුවේදී පෞද්ගලික ප්‍රකාශයක් සිදු කරයි.



දත්ත පරිශීලනය කිරීමේදී පෙට්‍රල් සහ ඩීසල් ආසන්න වශයෙන් රුපියල් 250ක මිලකට ශ්‍රී ලංකාව තුළ අළෙවි කළ හැකි බව ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ සභාපති ජනක රත්නායක මහතා පැවසීය.


ඒ මහතා මේ බව ප්‍රකාශ කළේ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ 2018,2019 වර්ෂයන්ට අදාළ විගණකාධිපති වාර්තා සහ වර්තමාන කාර්යසාධනය පිළිබඳ පරීක්ෂා කිරීමට පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව එහි සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී (මහාචාර්ය) ගරු චරිත හේරත් මහතාගේ සභාපතිත්වයෙන් මේ මස පාර්ලිමේන්තුවේදී රැස් වූ අවස්ථාවේදී ය.

මේ පිළිබඳ වැඩිදුරටත් පැහැදිලි කරමින් රත්නායක මහතා සඳහන් කළේ බණිජ තෙල් මිලදී ගැනීමේදී ඒවා ආනයනය කරන මිල ගණන් සහ රජය අයකරන බදු මුදල් පිළිබඳ සංඛ්‍යා ලේඛන නිවැරදිව පරීක්ෂා කිරීමේදී මේ බව හෙළි වන බවයි. ඒ අනුව පෙට්‍රල් සහ ඩීසල් දැන් ලබාදෙන මිලට වඩා රුපියල් 200 ක් අඩුවෙන් මෙරට තුළ අළෙවි කළ හැකි බව ඒ මහතා පෙන්වා දුන්නේය. මේ අනුව  ආසන්න වශයෙන් රුපියල් 250 ක් වැනි මිලකට පෙට්‍රල් සහ ඩීසල් මෙරට තුළ අලෙවි කළ හැකි බව සඳහන් කළ ඒ මහතා පසුගිය ජූලි 1 වැනිදා ගෙන්වන ලද ඩීසල් එක් ලීටරයක් සඳහා රුපියල් 280 ක බදු මුදලක් රජය අය කොටගෙන ඇති බව ද පැවසීය.

මෙය තමන්ගේ පෞද්ගලික ප්‍රකාශයක් බවත්, දත්ත පරිශීලනය කිරීමෙන් පසුව එම ප්‍රකාශය සිදු කරන බවත් ඒ මහතා මෙහිදී සඳහන් කළේය. මේ අනුව මේ පිළිබඳ  කොමිෂන් සභාවේ නිලධාරීන්ගේ දැනුවත් බව පිළිබඳ පැමිණ සිටි මන්ත්‍රීවරුන් විමසූ අතර ඒ පිළිබඳව මෙම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂක මණ්ඩලය දැනුවත් නැති බව අධ්‍යක්ෂ මණ්ඩලයේ නිලධාරීහු පැවසූහ. එසේම මේ පිළිබඳව මුදල් අමාත්‍යංශය විධිමත්ව දැනුවත් කිරීමක් සිදු කොට නැති බව ද  සඳහන් විය.

මෙහිදී මෙම කොමිෂන් සභාවේ සභාපතිධූරයට පත් වීම සඳහා තමන්ට පවතින සුදුසුකම් පිළිබඳ පැමිණ සිටි මන්ත්‍රීවරුන් රත්නායක මහතාගෙන් විමසන ලදී. ඒ අනුව තමන්ගේ අධ්‍යාපන සුදුසුකම් ලෙස ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් රාජ්‍ය පරිපාලන විශේෂ උපාධිය සහ කොළඹ විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය ලබාගෙන ඇති බව හෙතෙම පෙන්වා දුන්නේය. තවද හාවඩ් විශ්ව විද්‍යාලයේ ද අධ්‍යාපනය ලබාගෙන ඇති බව ඒ මහතා පැවසීය.

# පාර්ලිමේන්තුව වාර අවසාන කිරීම සිදු වන්නේ කොහොමද?



## හරියටම දැනගමු.

පාර්ලිමේන්තු ඉතිහාසය තුළ විවිධ අවස්ථාවන්හිදී පවත්නා පාර්ලිමේන්තු සභාවාරය වාර අවසාන කොට නව සභාවාරයක් ආරම්භ කරන අවස්ථා දක්නට ලැබෙනවා. මෙසේ පාර්ලිමේන්තු සභාවාරයක් වාර අවසාන කිරීමේ ක්‍රියාවලියේ නෛතික ප්‍රතිපාදන පිළිබඳ මෙන්ම ඓතිහාසික සහ ප්‍රායෝගික පසුබිම පිළිබඳවත් සොයා බැලීම ඉතා වැදගත්.

**වාර අවසාන කිරීමේ බලය හිමි වන්නේ කාටද?**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70(1) වගන්තියට අනුව පාර්ලිමේන්තුව කැඳවීම, වාර අවසාන කිරීම සහ විසුරුවා හැරීමේ පූර්ණ බලතල විධායක ජනාධිපතිවරයා වෙත හිමිවෙනවා.

**නව සභාවාරය කැඳවන දිනය තීරණය කරන්නේ කොහොමද?**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70(3) වගන්තියට අනුව පාර්ලිමේන්තුවේ වාර අවසාන කරන ප්‍රකාශනය (ගැසට් නිවේදනය) මගින්ම නව සභාවාරය පටන් ගන්නා දිනය නියම කළ යුතු වනවා. එම දිනය පාර්ලිමේන්තුව වාර අවසාන කරන ප්‍රකාශනයේ දිනයේ සිට මාස දෙකක් නොඉක්මවන දිනයක් වියයුතුයි.

නමුත් පාර්ලිමේන්තුවක් වාර අවසාන කොට නැවත කැඳවීමේ දිනයක් ප්‍රකාශයට පත් කොට ඇති අවස්ථාවකදී එම කැඳවීමේ දිනයට පෙර පාර්ලිමේන්තුව කැඳවීමේ හැකියාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70(3) (ස) අනුව ජනාධිපතිවරයා වෙත හිමි වෙනවා. ඒ අනුව නැවතත් ප්‍රකාශනයක් (ගැසට් නිවේදනයක් ) මගින් එසේ පාර්ලිමේන්තුව කැඳවීමට අපේක්ෂා කරන දිනය ප්‍රකාශයට පත් කරන අතර එසේ ප්‍රකාශනයේ දිනයේ සිට දින තුනක් ඉක්ම ගිය පසු දිනයක පාර්ලිමේන්තුව කැඳවීමේ බලය ජනාධිපතිවරයා වෙත හිමි වෙනවා.

**පාර්ලිමේන්තුවක් වාර අවසාන කිරීමෙන් එහි කටයුතු සියල්ල නවතිනවාද?**

පාර්ලිමේන්තුව වාර අවසාන කළ විටකදී එහි කටයුතු සියල්ලම නවතින බව බොහෝදෙනාගේ අදහසයි. නමුත් එය එසේ වන්නේ නැහැ.

**වාර අවසාන කිරීමකදී පාර්ලිමේන්තුව තුළ ඒ වන විට පැවති සියලු කටයුතු අත්හිටුවීම සහ දෝෂාභියෝග හැර ඒ වනවිට සභා ගර්භය තුළ සිදුවෙමින් පැවති සියලු ක්‍රියාවලි තාවකාලිකව නතරවීම සිදුවෙනවා.**

වාර අවසාන කිරීමක් අතරතුරදී, කථානායකවරයා අඛණ්ඩව සිය කාර්යයන් ඉටුකරනු ලබනවා. ඒ අතරම මන්ත්‍රීවරයන් පාර්ලිමේන්තු රැස්වීම් වලට සහභාගි නොවූවද ඔවුන් සිය ධුරයේ රැඳී සිටිනවා. නමුත් වාර අවසාන කිරීමකදී පාර්ලිමේන්තුව තුළ ඒ වන විට පැවති සියලු කටයුතු අත්හිටුවීම සහ දෝෂාභියෝග හැර ඒ වනවිට සභා ගර්භය තුළ සිදුවෙමින් පැවති සියලු ක්‍රියාවලි තාවකාලිකව නරතවීම සිදුවෙනවා.

නමුත් එකම කරුණක් හා සම්බන්ධ පනත් කෙටුම්පතක්, යෝජනාවක් හෝ ප්‍රශ්නයක් එම සභාවාරය තුළම දෙවැනි වතාවට ඉදිරිපත් කළ නොහැකි නමුත් වාරාවසාන කිරීමකින් අනතුරුව එළැඹෙන සභාවාරය දක්වා ගෙනයාමේ හැකියාව පවතිනවා.

"යථා පරිදි පාර්ලිමේන්තුව ඉදිරියට ගෙන එනු ලැබ, පාර්ලිමේන්තුවේ වාරය අවසාන කරන අවස්ථාව වන විට කටයතු නිම කරනු නොලැබ ඇති යම් කාරණා ඇත්තේ ද, ඒ සියලු කාරණා පිළිබඳව පාර්ලිමේන්තුවේ ඊළඟ සභාවාරයේ දී ඉතිරි පියවර ගැනීමට පාර්ලිමේන්තුවට බලය ඇත්තේ ය" යනුවෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70.(4 ) වන පරිච්ඡේදයේ සඳහන් වෙනවා.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මෙම ප්‍රතිපාදනය තුළ පාර්ලිමේන්තුව වාර අවසාන කිරීම නිසා ඉදිරියේදී ගැනීමට නියමිත කටයුතු අහෝසි වීමක් සිදු වන්නේ නැහැ. එහිදී, ඉදිරියට ගැනීමට නියමිත කටයුතු පාර්ලිමේන්තුවේ නව සභාවාරය ආරම්භ වූ වහාම එය පැවති තත්ත්වයේ සිට ඉදිරියට කටයුතු සිදු කිරීමට හැකියාව ලැබෙනවා. මෙහිදී ඉදිරියට ගෙනආයුතු ආණ්ඩුවේ කටයුතු සභානායකවරයා විසින් තීරණය කරනු ලබන අතර පෞද්ගලික මන්ත්‍රී කෙටුම්පතක් හෝ යෝජනාවක් නම් එය නැවත නැවුම්ව ඉදිරිපත් කළයුතු වෙනවා.

පාර්ලිමේන්තුවේ නව සභාවාරයක් ආරම්භ වන අවස්ථාවේ න්‍යාය පත්‍රයේ පෙළ ගස්වා තිබෙන සභාවේ කටයුතු පිළිබඳ විෂයයන් අඛණ්ඩව පවත්වාගැනීම අවශ්‍ය වන්නේ නම් ඒවා නැවත ලැයිස්තුගත කළ යුතු වෙනවා.

**පාර්ලිමේන්තුව වාර අවසාන කිරීමේදී කාරක සභා සියල්ල අහෝසි වෙනවාද?**

පාර්ලිමේන්තුව වාර අවසාන කිරීමකදී එහි පැවතෙමින් තිබූ කාරක සභාවලට සිදුවන්නේ කුමක්ද යන්න බොහෝදෙනා තුළ මතුවන ගැටලුවක්. එහිදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 109, 111(2), 124(5), 125.(1)අනුව පිළිවෙලින් පාර්ලිමේන්තුවේ විශේෂ කාරක සභා, ආංශික අධීක්ෂණ කාරක සභා උසස් නිලතල පිළිබඳ කාරක සභාව සහ සම්බන්ධීකරණ කාරක සභාව හැර අන් සියලු කාරක සභා පාර්ලිමේන්තුවේ සභාවාරය නැවත ආරම්භ වන අවස්ථාවේ නැවත ස්ථාපිත කිරීමත් සිදු වෙනවා. මෙහිදී ස්ථාවර නියෝග 125.1 අනුව සම්බන්ධිකරණ කාරක සභාව සඳහා සමාජිකයන් නිල බලයෙන් (කථානායක, නියෝජ්‍ය කථානායක ආදී තනතුර අනුව) පත්වන නිසාවෙන් එහි වෙනසක් සිදුවන්නේ නැහැ.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 114 අනුව සෑම නව සභා වරයකදීම තේරීම් කාරක සභාව අළුතෙන් පත් කෙරෙනවා. එහිදී විශේෂ කාර්යයන් සඳහා වන පහත සඳහන් සියලු කාරක සභා පාර්ලිමේන්තුවේ වාර අවසන් කිරීමකදී අහෝසි වීමට ලක් වෙනවා.

- අමාත්‍යංශයීය උපදේශක කාරක සභා
- ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව
- පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව
- ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව
- ගෘහ්‍ය කාරක සභාව
- ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව
- රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව
- පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව
- රජයේ මුදල් පිළිබඳ කාරක සභාව
- මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව
- පසුපෙළ මන්ත්‍රීන්ගේ කාරක සභාව

**පාර්ලිමේන්තුවේ නව සභා වාරයක් ආරම්භ වන්නේ කොහොමද?**

පාර්ලිමේන්තුව වාර අවසාන කිරීමක් අවසානයේ දී නව සභාවාරය ආරම්භ වන අවස්ථාව උත්සවාකාරයෙන් විවෘත්ත කිරීම අත්‍යවශ්‍යම සාධකයක් නොවේ. නමුත් එසේ නව සභාවාරය උත්සවාකාරයෙන් ආරම්භ කරන්නේ නම් එය අනිවාර්යයෙන්ම ජනාධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් සිදු වෙනවා.

පාර්ලිමේන්තුවේ එක් එක් සභාවාරය ආරම්භයේ දී ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කිරීම සිදුවෙනවා.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33(අ) අනු ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තුවේ සභාවාරයක් ආරම්භයේදී ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කිරීමටත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 (ආ) අනු ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තුවේ මංගල රැස්වීම්වල මුලසුන දැරීමටත්, ජනාධිපතිවරයාට බලතල හිමිවී තිබෙනවා.

**ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය යනු කුමක්ද?**

පාර්ලිමේන්තුවේ සෑම නව සභාවාරයක් ආරම්භයේ දී ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ බලය ජනාධිපතිවරයාට හිමිවී තිබෙනවා. මෙහිදී සිය ආණ්ඩුවේ ඉදිරි දැක්ම පිළිබඳ සවිස්තරාත්මක විග්‍රහයක් ජකාධිපති-වරයා විසින් සිය ප්‍රතිපත්ති ප්‍රකාශය මගින් පාර්ලිමේන්තුවට සහ මහජනතාවට ඉදිරිපත් කරනු ලබනවා.

අතීතයේ එය හඳුන්වනු ලැබුවේ රාජාසන කථාව නමින් වන අතර එය ඉදිරිපත් කරන ලද්දේ අග්‍රාණ්ඩුකාරවරයා විසිනි.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ එක් එක් පාර්ලිමේන්තු තුළ ආරම්භවූ නව සභාවාරයන් ගණන**

පාර්ලිමේන්තු වාර්තා අනුව අනාවරණය වනුයේ පාර්ලිමේන්තුව 1947 සිට 50 වරක් පමණ වාරාවසාන කර ඇති බවයි. 1978 සිට මේ දක්වා සභාවාර 25කට වඩා පවත්වනු ලැබ තිබෙනවා. ඒවා මෙසේය.

- පළමුවන පාර්ලිමේන්තුවේ 1978/09/07 දින සිට 1988/12/20 දක්වා සභාවාර 08ක් පැවැත්විණි.
- දෙවන පාර්ලිමේන්තුවේ 1989/03/09 සිට 1994/06/24 දක්වා සභාවාර 05ක් පැවැත්විණි.
- තුන්වන පාර්ලිමේන්තුවේ 1994/08/25 සිට 2000/08/18 දක්වා සභාවාර 03ක් පැවැත්විණි.
- හතරවන පාර්ලිමේන්තුවේ 2000/10/18 දින සිට 2001/10/10 දක්වා සභාවාර 03ක් පැවැත්විණි.
- පස්වන පාර්ලිමේන්තුවේ 2001/12/19 සිට 2004/02/07 දක්වා සභාවාර 02ක් පැවැත්විණි.
- හයවන පාර්ලිමේන්තුවේ 2004/04/22 සිට 2010/02/09 දක්වා සභාවාර 04ක් පැවැත්විණි.<br>2010 මාර්තු 09 වැනිදා පාර්ලිමේන්තුව යළි රැස්කරන ලදී.<br>(හදිසි අවස්ථා ප්‍රකාශනය කිරීම පිළිබඳව පාර්ලිමේන්තුවට දැනුම් දීම සඳහා)
- හත්වන පාර්ලිමේන්තුවේ 2010/04/22 සිට 2015/06/26 දක්වා සභාවාර 01ක් පැවැත්විණි.
- අටවැනි පාර්ලිමේන්තුවේ 2015/09/01 සිට 2020/03/02 දක්වා සභාවාර 04ක් පැවැත්විණි.
- නවවැනි පාර්ලිමේන්තුවේ 2020/08/20 සිට 2022/07/28 දක්වා සභාවාර 02ක් පැවැත්විණි.

නිම්මි හාතියල්දෙණිය
මාධ්‍ය කළමනාකරු
සන්නිවේදන දෙපාර්තමේන්තුව

# 1981 අංක 2 දරන ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත ප්‍රකාරව ජනාධිපතිධූරය හිස්වූ අවස්ථාවක ජනාධිපතිවරයා තෝරා පත්කරගන්නා ආකාරය



ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 38 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනු ව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපතිධූරය හිස් වූ අවස්ථාවක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 40 වැනි ව්‍යවස්ථාව මගින් දක්වා ඇති පරිදි ධූරය හිස් වූ ජනාධිපතිවරයාගේ ධූර කාලයෙන් ඉතිරි කාලය තුළ පමණක් ධූරය දැරීමට පාර්ලිමේන්තුව විසින් එහි මන්ත්‍රීවරයන් අතුරෙන් ජනාධිපති ධූරයට තෝරා පත්කර ගනු ලැබීමට සුදුසුකම් ඇති යම් මන්ත්‍රීවරයෙකු ජනාධිපත්වරයා ලෙස තෝරාපත්කරගැනීම සිදු කළ යුතුය.

මෙහිදී මෙම තෝරාපත්කරගැනීම 1981 අංක 2 දරන ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ විධි විධාන  අනුගමනය කරමින් සිදු වේ.

විශේෂයෙන්ම මෙම ක්‍රියාවලිය පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ මූලිකත්වයෙන් සිදු වන අතර මෙම ඡන්ද විමසීමේදී කථානායකවරයාට ද ඡන්දයක් හිමිවේ. එසේම මෙම ක්‍රියාවලිය සඳහා පාර්ලිමේන්තුව දින 3ක් රැස්වීම සිදුවේ.

මේ අනුව පනතේ දක්වා ඇති විධි විධාන යටතේ පහත පියවරයන් අනුගමනයකරමින් මෙම තෝරා පත්කරගැනීම සිදුවේ.

- මෙහිදී ජනාධිපතිධූරය හිස් වූ දිනට පසුව හැකි ඉක්මනින් ද එසේම එදින සිට මාසයක් නොඉක්මවිය යුතු පරිදි ද එම තෝරා පත් කර ගැනීම සිදු කළ යුතුය.

- ඒ අනුව එම පුරප්පාඩුව ඇති වී දින තුනක් ඇතුළත පාර්ලිමේන්තුව කැඳවිය යුතු අතර එහිදී පාර්ලිමේන්තුව රැස්වීම සඳහා නියමිත දිනය සහ වේලාව පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා විසින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට  දැනුම් දීම සිදුවේ.

- එසේ පාර්ලිමේන්තුව රැස්වූ විට ජනාධිපතිධූරයෙහි පුරප්පාඩුවක් ඇති වී තිබෙන බව පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා විසින් පාර්ලිමේන්තුවට දන්වා සිටිය යුතුය. මේ අනුව එම රැස්වීම් දිනයෙහි සිට පැය 48කට කලින් නොවන්නාවූ සහ දින 7කට පසු නොවන්නා වූ දිනයක ජනාධිපතිධූරය සඳහා නාම යෝජනා බාර ගනු ලබන දිනයක් සහ වේලාවක් පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා විසින් නියම කළ යුතුය.

- නාම යෝජනා භාර ගැනීම සඳහා නියම කරනු ලැබූ දිනයේ දී පාර්ලිමේන්තුව රැස් විය යුතු අතර මහලේකම්වරයා තේරීම්භාර නිලධාරියා වශයෙන් ක්‍රියා කිරීම සිදුවේ.  මේ අනුව මෙදින ජනාධිපතිධූරය සඳහා තෝරාපත්කර ගැනීමට යම් මනිත්‍රීවරයෙකුගේ නමක් යෝජනා කිරීමට අපේක්ෂා කරන සෑම මන්ත්‍රීවරයෙකුම තමා විසින් එසේ යෝජනා කරනු ලබන මන්ත්‍රීවරයා තෝරා පත් කර ගනු ලැබුවහොත්, ජනාධිපතිධූරයෙහි සේවය කිරීමට ඔහු කැමැති බවට ලිඛිත එකඟත්වයක් කලින් ලබාගෙන තිබිය යුතුය. එසේම අපේක්ෂකත්වයට යෝජනා වූ මන්ත්‍රීවරයා එදින පාර්ලිමේන්තුවේ සිටිය යුතුය.

**පාර්ලිමේන්තුව රැස්වූ විට ජනාධිපතිධුරයෙහි පුරප්පාඩුවක් ඇති වී තිබෙන බව පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා විසින් පාර්ලිමේන්තුවට දන්වා සිටිය යුතුය. මේ අනුව එම රැස්වීම් දිනයෙහි සිට පැය 48කට කලින් නොවන්නා වූ සහ දින 7කට පසු නොවන්නා වූ දිනයක ජනාධිපතිධුරය සඳහා නාම යෝජනා බාර ගනු ලබන දිනයක් සහ වේලාවක් පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා විසින් නියම කළ යුතුය.**

■ මෙහිදී ජනාධිපති ධුරය සඳහා එක් මන්ත්‍රීවරයකු පමණක් එසේ යෝජනා කරනු ලැබ ස්ථිර කරනු ලැබුවේ නම් පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා විසින් එම මන්ත්‍රීවරයා ජනාධිපතිධුරය සඳහා තෝරාපත්කර ගනු ලැබූ බව ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතුය. එක් මන්ත්‍රීවරයෙකුට වඩා වැඩි දෙනෙකු මෙසේ යෝජනා කරනු ලැබ ස්ථිර කරනු ලැබුවේ නම් ඡන්ද විමසීමක් සඳහා දිනයක් සහ වේලාවක් පාර්ලිමේන්තුව විසින් නියම කළ යුතුය. එම දිනය නාම යෝජනා පත්‍ර භාර ගැනීමේ වේලාවෙන් පැය 48 කට පසුව වූ දිනයක් නොවිය යුතුය.

■ ඉන්පසුව ඡන්ද විමසීම සඳහා නියම කරනු ලැබූ දිනයේදී පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා තේරීම්භාර නිලධාරියා වශයෙන් ක්‍රියා කළ යුතු අතර ඡන්දය දීම ආරම්භ කිරීමට පෙර ඔහු විසින් හිස් ඡන්ද පෙට්ටිය හෝ හිස් ඡන්ද පෙට්ටි මන්ත්‍රීවරුන්ට පෙන්වා ඒවාට මුද්‍රා තැබීම සිදුකළ යුතුය. මේ අනුව ඡන්දය දීම ආරම්භ කළ විට තේරීම්භාර නිලධාරියා ලෙස කටයුතු කරන මහලේකම්වරයා විසින් කථානායකවරයා ඇතුලු එක් එක් මන්ත්‍රීවරයාගේ නම අඬගසනු ලැබිය යුතු අතර එම එක් එක් මන්ත්‍රීවරයා තේරීම්භාර නිලධාරියා ගේ මේසය වෙත ගොස් ඡන්ද පත්‍රිකාවක් ලබාගෙන ඡන්දය සළකුණු කිරීම සිදුකළ යුතුය. ඉන්පසු එය ඡන්ද පෙට්ටියට දැමීම සිදුකළ යුතුය.

එසේම මන්ත්‍රීවරයෙකු විසින් අනවධානයෙන් ඡන්ද පත්‍රිකාවක් නරක් කරන ලද්දේ නම් එය තේරීම්භාර නිලධාරියාට ආපසු දිය හැකි අතර මේ පිළිබඳ තේරීම්භාර නිලධාරියා සෑහීමකට පත්වන්නේ නම් වෙනත් ඡන්ද පත්‍රිකාවක් ඔහුට දිය යුතුය. තව ද එම නරක් වූ ඡන්ද පත්‍රිකාව තේරීම්භාර නිලධාරියා විසින් නොපමාවම අවලංගු කළ යුතුය. මෙහිදී නම අඬ ගැසූ විට ඡන්දය නොදුන් යම් මන්ත්‍රීවරයෙකුගේ නම ඡන්දය දීම අවසන් කළයුතු වෙලාවට පෙර දෙවන වරටත් අඬ ගසන අතර එහිදී ද එම මන්ත්‍රීවරයා ඡන්දය නොදෙන්නේ නම් ඔහු ඡන්දය දීමෙන් වැළකී සිටිය ලෙස සලකනු ලැබේ.

■ මේ අනුව එක් මන්ත්‍රීවරයෙකුට එක් ඡන්දයක් පමණක් හිමි වන අතර ඡන්දය දෙන අපේක්ෂකයාගේ නම ඉදිරියෙන් ඇති කොටුවෙහි "1" යන ඉලක්කම යෙදීම මගින් ඡන්දය සළකුණු කිරීම සිදුකළ යුතුය. මෙහිදී අපේක්ෂකයින් කිහිපදෙනෙක් යෝජනාවී ඇති අවස්ථාවක මනාප සළකුණු කිරීමටද අවස්ථාව පවතී. ඒ අනුව ඉදිරිපත්වී ඇති අපේක්ෂකයන් ගණන අනුව අනෙකුත් ඡන්ද අපේක්ෂකයන්ගේ නම් ඉදිරියේ ඇති කොටු තුළ 2,3 ආදී ලෙස මනාපයන් අනුපිළිවෙල අනුව යෙදිය හැකිය.

■ මෙසේ ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව ඡන්ද ගණන් කිරීම සිදුවේ. ඡන්දය ගණන් කිරීම සිදුකරන ස්ථානයට යම් අපේක්ෂකයෙකු පැමිණීමට කැමති නම් ඔහුට ඒ සඳහා අවස්ථාව හිමිවන අතර නැතහොත් තමා නියෝජනය කිරීමට වෙනත් මන්ත්‍රීවරයකු එම ස්ථානයට යෑමට පත්කිරීමට එම අපේක්ෂකයාට හැකිය.

■ දෙන ලද වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් දෙකෙන් එකකට වැඩි ඡන්ද සංඛ්‍යාවක් යම් අපේක්ෂකයෙකු ලබා ගන්නේ නම් එම අපේක්ෂකයා ජනාධිපතිධුරයට තෝරා පත් කර ගනු ලැබූ බව මෙහිදී තේරීම්භාර නිලධාරියා එනම් පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා විසින් නොපමාව ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතුය.

■ එසේම දෙන ලද වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් දෙකෙන් එකකට වැඩි ඡන්ද සංඛ්‍යාවක් කිසිම අපේක්ෂකයකුට ලැබී නොමැති අවස්ථාවල සටහන් කර ඇති දෙවන, තෙවන ආදී මනාප පරීක්ෂා කිරීම සිදුවේ. මෙහිදී අවම මනාප ලබා ගත් අපේක්ෂකයන් ඉවත් කරමින් ඔවුන්ට දෙන ලද දෙවන මනාප ගණන් කිරීම සිදු කරයි.


■ ගණනය කිරීමේදී වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් දෙකෙන් එකකට වැඩි ඡන්ද සංඛ්‍යාවක් කිසිම අපේක්ෂකයෙකු විසින් ලබාගෙන නොමැති අවස්ථාවකදී එකී ගණන් කිරීමේ දී බහුතර ඡන්ද සංඛ්‍යාවක් ලබා ගෙන ඇති අපේක්ෂකයා ජනාධිපතිධුරයට තෝරා පත් කර ගනු ලැබූ බව තේරීම්භාර නිලධාරියා විසින් ප්‍රකාශයට පත් කරනු ලබයි.

■ එසේම අපේක්ෂකයන් දෙදෙනෙකු හෝ කිහිපදෙනෙකු අතර ඡන්ද සමාන වූ විට කුසපත් ඇදීමක් සිදු වේ.

ආසිරි හපුගොඩ
මාධ්‍ය නිලධාරී
සන්නිවේදන දෙපාර්තමේන්තුව

# පාර්ලිමේන්තුව සැකෙවින්...

## ජූලි 2022



මෙවර සටහන - **එච්. ඊ. ජනකාන්ත සිල්වා** - අධ්‍යක්ෂ (ව්‍යවස්ථාදායක සේවා) / අධ්‍යක්ෂ (සන්නිවේදන) (වැඩබලන)

### ජූලි

**2022.07 .06**

- සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට පිළිගන්වනු ලැබීම.
- තරුණ නියෝජනය වැඩි කිරීමට ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රමයට අදාළ 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ, 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් සහ 1946 අංක 53 දරන පළාත් පාලන ආයතන මැතිවරණ නීති සංශෝධනය කිරීම සඳහා යෝජනා ඇතුළත් පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් ත්‍රිත්වයක් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඉම්තියාස් බාකිර් මාකර් මහතා විසින් පෞද්ගලික මන්ත්‍රී පනත්කෙටුම්පත් ලෙස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.

**2022.07.15**

- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 38 ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් 2022 ජූලි 14 දින සිට ජනාධිපතිධුරයෙන් නීත්‍යානුකූලව ඉල්ලා අස්වී ඇති බව දන්වමින් කථානායකවරයා වෙත ඉල්ලා අස්වීමේ ලිපිය එවීම.

**2022.07.16**

- අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 38(1)(ආ) ව්‍යවස්ථාව ප්‍රකාරව 2022 ජූලි 14 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්වීම හේතු කොට ගෙන ජනාධිපති ධුරයේ පුරප්පාඩුවක් ඇති වී තිබෙන බව 1981 අංක 2 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 5 වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා විසින් පාර්ලිමේන්තුවට නිවේදනය කිරීම.
- එකී පනතේ 5 වගන්තිය ප්‍රකාරව, අද රැස්වීමේ දින සිට පැය හතළිස් අටකට කලින් නොවන්නා වූ සහ දින හතකට පසු නොවන්නා වූ දිනයක තමා විසින් නාම යෝජනා භාරගනු ලබන දිනයක් සහ වේලාවක් නියම කළ යුතු බැවින් එකී දිනය සහ වේලාව වශයෙන් 2022 ජූලි 19 අඟහරුවාදා පූර්ව භාග 10.00 ට පාර්ලිමේන්තුව රැස්වී නාම යෝජනා භාරගැනීමේ කාර්යයේ නිරත විය යුතු බවත් මහලේකම්වරයා පාර්ලිමේන්තුවට දන්වා සිටීම.

**2022.07.19**

- හිටපු ජනාධිපති අතිගරු ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ඉල්ලා අස්වීමත් සමග හිස් වූ ජනාධිපති ධුරයේ පුරප්පාඩුව සඳහා වැඩබලන ජනාධිපති සහ අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩලස් අලහප්පෙරුම සහ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අනුර කුමාර දිසානායක යන මහත්වරුන්ගේ නම් පාර්ලිමේන්තුවේදී යෝජනා ස්ථිර කිරීම.
- මෙම අපේක්ෂකයන් තිදෙනාගේ නාම යෝජනා 1981 අංක 2 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතට අනුව අනුප්‍රාප්තික ජනාධිපති ධුරය සඳහා භාරගත් බව පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා විසින් පාර්ලිමේන්තුවට නිවේදනය කිරීම.



- ඊට අනුකූලව, ජුලි 20 දින අනුප්‍රාප්තික ජනාධිපතිවරයා ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ඡන්දයෙන් මෙම මන්ත්‍රීවරුන් තිදෙනා අතුරින් කෙනෙකු තෝරා පත්කර ගැනීමට නියමිතව බැවි-න් එම දිනට පාර්ලිමේන්තුව කල්තැබීම.

## 2022.07.20

- 1981 අංක 2 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතට අනුව අනුප්‍රාප්තික විධායක ජනාධිපති ධුරය සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ඡන්ද විමසීම.
- ගරු  රනිල්  වික්‍රමසිංහ මහතාට ඡන්ද 134 ක් ද, ගරු ඩලස් අලහප්පෙරුම මහතාට ඡන්ද 82ක් ද, ගරු  අනුර කුමාර දිසානායක මහතාට ඡන්ද 03 ක් ද, ලැබුණු අතර  අනුප්‍රාප්තික ජනාධිපති ධුරය සඳහා තේරී පත්වීමට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් 50% වැඩි ඡන්ද සංඛ්‍යාවක් යම් අපේක්ෂකයෙකු ලබාගත යුතු බැවින් එම ඡන්ද සංඛ්‍යාව ගරු රනිල් වික්‍රමසිංහ මහතා සපුරා තිබීම හේතුවෙන්   වැඩබලන ජනාධිපති සහ අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මහතා අටවැනි විධායක ජනාධිපතිවරයා ලෙස තේරී පත් වී ඇති බව    පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් පාර්ලිමේන්තුවට නිවේදනය කිරීම.
- වලංගු ඡන්ද සංඛ්‍යාව වූයේ ඡන්ද 219ක් බවත්,  පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දෙදෙනෙක් ඡන්දය දීමෙන් වැලකී සිටි බවත්, ඡන්ද 4ක් ප්‍රතික්ෂේපිත ඡන්ද ලෙස නම් කරන ලද බවත්, මහ ලේකම්වරයා විසින් පාර්ලිමේන්තුවට ප්‍රකාශ කිරීම.
- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අට වැනි විධායක ජනපතිවරයා ලෙස ගරු රනිල් වික්‍රමසිංහ මහතා පාර්ලිමේන්තු සංකීර්ණයේදී අගවිනිසුරු ජයන්ත ජයසූරිය මහතා ඉදිරියේ දිවුරුම් දීම.

## 2022.07.27

- ගරු රනිල් වික්‍රමසිංහ මහතා ජනාධිපතිධුරයේ දිවුරුම් දීම නිසා පුරප්පාඩු වූ එක්සත් ජාතික පක්ෂයේ ජාතික ලැයිස්තු මන්ත්‍රීධුරය සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් නම් කරන ලද වජිර අබේවර්ධන මහතා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස කථානායකවරයා ඉදිරියේ දිවුරුම් දීම.
- පාර්ලිමේන්තුවේ සභානායකවරයා ලෙස අධ්‍යාපන අමාත්‍ය (ආචාර්ය) ගරු සුසිල් ප්‍රේමජයන්ත සහ ආණ්ඩු පාර්ශවයේ ප්‍රධාන සංවිධායකවරයා ලෙස නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍ය ගරු ප්‍රසන්න රණතුංග යන මහත්වරුන් පත් කරනු ලැබ ඇති බව පාර්ලිමේන්තුවට නිවේදනය කිරීම.
- ජනාධිපතිවරයා විසින් ප්‍රකාශයට පත්කරන ලද හදිසි අවස්ථා ප්‍රකාශනය පිළිබඳ යෝජනා සම්මතය වැඩි ඡන්දයෙන් පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබීම.

## 2022.07.29

- ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා විසින් ජුලි 28 මධ්‍යම රාත්‍රියේ සිට බලපැවැත්වෙන පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපතිවරයාට පැවරී ඇති බලතල අනුව පාර්ලිමේන්තුව වාරාවසාන කරන ලද අතර නවවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරය ලබන අගෝස්තු 03 පූර්ව භාග 10.30 ට ආරම්භ කරන ලෙස ප්‍රකාශයට කිරීම ගැසට්පත්‍රයේ පළකරනු ලැබීම.

පාර්ලිමේන්තු ඡායා ගැලරිය







ඕමාන තානාපතිවරයා කතානායකවරයා හමුවෙයි

# පාර්ලිමේන්තු විත්ති


පුවත් හසුන I 25 වැනි කාණ්ඩය I ජූලි 2022

ISSN 2806 – 5425



සන්නිවේදන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

දුරකථනය : +94 11 2777100 ෆැක්ස් : +94 11 2777227

www.parliament.lk

Parliament of Sri Lanka

@ParliamentLK

@slparliament

Parliament of Sri Lanka